# කොළඹ විශ්වවිද්‍යාලයේ
# ආපනශාලා හා කිරිහල් සේවාව සඳහා ලංසු කැඳවීම

# ලංසු ලේඛණය

| | |
|---|---|
| ලංසු විවෘත කිරීමේ දිනය | **2025.09.04** |
| ලංසු වලංගු කාල සීමාව | දින 90 |
| ආපසු නොගෙවන ලංසු  තැන්පතු මුදල | රු.**1,000/-** |

කොළඹ විශ්වවිද්‍යාලය,
**94**, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

# කොළඹ විශ්වවිද්‍යාලය
# ප්‍රසම්පාදන දැන්වීම

## කොළඹ විශ්වවිද්‍යාලයේ
## ආපනශාලා හා කිරිහල් සේවාව සඳහා මිල ගණන් කැඳවීම.

පහත සඳහන් ආපනශාලා/කිරිහල් සේවාවන් පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්/ ආයතන වලින් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| **ආපනශාලාව/කිරිහල** | **ගිවිසුම් කාල සීමාව** |
|---|---|
| **ආපනශාලා සේවාව -** | |
| • හෙද පීඨ ආපනශාලාව | - 2025.09.15 – 2026.09.14 |
| • කළමනාකරණ හා මූල්‍ය පීඨ ආපනශාලාව | - 2025.10.04 – 2026.10.03 |
| • තාක්ෂණ පීඨ ආපනශාලාව | - 2025.09.16 – 2026.09.15 |
| **කිරිහල් සේවාව -** | |
| • මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාර කිරිහල සහ සිල්ලර අලෙවිසැල | - 2025.09.15 – 2026.09.14 |

ඉහත සේවාවන් සඳහා අදාල ලංසු ලියවිලි රු. **1,000.00** ක ආපසු නොගෙවන ගාස්තුව **2025.08.18 – 2025.09.03** දින දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරිමේ ගිණුමට යොමු අංක **505170600013** බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවීමෙන් ලබා ගන්නා රිසිට්පත **2025.08.18 – 2025.09.04** දිනට පෙර ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයට ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැක.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන **2025.09.04** දින පස්වරු **2.30** ට පෙර ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ විද්‍යාල මන්දිර සැපයුම් අංශයේ තබා ඇති ලංසු බහාලනයට දැමිය හැකි අතර ලංසු විවෘත කිරීම ලංසු භාර ගැනීම අවසන් වූ වහාම කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාල මන්දිර මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී සිදු කරනු ලැබේ.
වැඩිදුර විස්තර **www.cmb.ac.lk** වෙබ් පිටුවට පිවිසීමෙන් ලබා ගත හැකිය.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
කොළඹ විශ්වවිද්‍යාලය,
94, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03

# කොළඹ විශ්වවිද්‍යාලයේ ආපනශාලා හා කිරිහල්සේවාව සඳහා කොන්ත්‍රාත් කොන්දේසි

01. කොළඹ විශ්වවිද්‍යාලයට අයත් පුරප්පාඩු වී ඇති ආපනශාලා හා කිරිහල් සේවාවන් පවත්වාගෙන යාම සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති, පුද්ගලයන්ගෙන් / ආයතනයන්ගෙන් 2025/2026 වර්ෂය සඳහා (ඉහත සේවාවට) සුදුසුකම්ලත් අයදුම්කරුවෙකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබේ.

   i. මූල්‍යමය හැකියාවක් ඇති (වාර්ෂික ආදායම රු. 500,000/- ට නොඅඩු).
   ii. පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන ආපනශාලා සේවාවක් සඳහා අවම වශයෙන් අවුරුදු 03ක පළපුරුද්ද.

02 ඉහත සඳහන් එක් සේවාවක් සඳහා එක් පරිශ්‍රයකට අදාලව ලංසු ලියාපදිංචි වීමේ ගාස්තුව ලෙස ආපසු නොගෙවනු ලබන රු. 1,000.00 ක ලංසු තැන්පතුවක් ඕනෑම මහජන බැංකු ශාඛාවකට 505170600013 අංකය භාවිතා කර ගෙවා ලබා ගත් ලදුපත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ශිෂ්‍ය හා සේවක කටයුතු වෙත ඉදිරිපත් කර ලංසු ලියවිලි ලබා ගත හැක.

03 එක් ආයතනයකට හෝ පුද්ගලයෙකුට එක් සේවාවක් හෝ කීපයක් හෝ පරිශ්‍ර කිහිපයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ආපනශාලා/ කිරිහල් සේවාවන් වෙනුවෙන් ලංසු ඉදිරිපත් කළ හැකි අතර සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම විශ්වවිද්‍යාලයීය ප්‍රසම්පාදන කමිටුව මගින් තීරණය කරනු ලැබේ.

04 **විශ්වවිද්‍යාලය විසින් එවනු ලබන අදාල ලංසු කැඳවීමේ පත්‍රය සම්පූර්ණ කර** පිටපතක් සමඟ කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ දිනය යොදා මුද්‍රා තබන ලද කවරයක බහා,එහි වම් පස ඉහළ කෙළවරේ "**..............................ආපනශාලා/කිරිහල්** සේවාව වෙනුවෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීම 2025/2026" සඳහන් කර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, කොළඹ විශ්වවිද්‍යාලය, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 යන ලිපිනයට 2025.09.04 දින ප.ව. 2.30 ට හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යාල මන්දිර සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට හෝ බහාලිය හැක.

05 **සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග පහත ලේඛන ද එවිය යුතුය.**

- **අයදුම්කරුගේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (**Business Registration).
- **මූල්‍යමය ස්ථාවරය සනාථ කිරීමේ පිටපත - පසුගිය වසර දෙක අවසානයේදී ඉතිරි කිරීමේ/ජංගම/ස්ථාවර තැන්පතු වල අවසාන බැංකු ශේෂය තහවුරු කිරීම සඳහා බැංකුව විසින් සහතික කොට ලබා ගන්නා ලිපිය.**
- **අනුයාත වසර තුනක (2022, 2023, 2024) පළපුරුද්ද සනාථ කිරීමේ සේවා සහතික පිටපත්.**

06. මෙම ප්‍රසම්පාදන සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම හෝ නොගැනීම මෙන්ම ලංසු සියල්ලම ප්‍රතික්ෂේප කිරීම සඳහා විශ්වවිද්‍යාලයීය ප්‍රසම්පාදන මණ්ඩලට හැකියාව ඇත.

07. සාර්ථක ලංසුකරුවෙත, ලංසුව පිළිගත් බැව් දැන්වූ ලිපියේ දින සිට දින 07 ක් ඇතුළත කොන්ත්‍රාත්තු සඳහා ගිවිසුම් ගත විය යුතුය. ගිවිසුම් ගත දිනයේ සිට ඉදිරියට **මාස 13ක** කාලසීමාවක් සඳහා කොන්දේසි විරහිත(ඉල්ලූ විට ගෙවන) වලංගු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික වානිජ බැංකුවකින් ලබාගත් **රු. 50,000.00 ක කාර්ය සාධන බැංකු සුරක්ෂණයක් උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය නමට ලබා ගත යුතුය. එසේ නැතහොත් ඔබ විසින් මුදල් තැන්පතුවක් කරන්නේ නම් ඕනෑම මහජන බැංකු ශාඛාවක යොමු අංක 505170700003 ට තැන්පත් (ආපසු ගෙවනු ලබන තැන්පතුව) කර ලබා ගත් ලදු පත** ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කල යුතුය.

08. ඉහත සේවාවන් සඳහා අයකිරීම් පහත පරිදි වන අතර අදාල වර්ෂය තුල එම මුදල නොවෙනස්ව පවති.

- හෙද පීඨ ආපනශාලාව, කළමනාකරණ හා මූල්‍ය පීඨ ආපනශාලාව සහ තාක්ෂණ පීඨ ආපනශාලාව සඳහා මාසික කුලිය **රු. 2,000.00** බැගින් වාර්ෂික කුලිය **රු.24,000.00** ක් ද මාසික විදුලි ගාස්තුව **රු.10,000.00** බැගින් වාර්ෂික විදුලි ගාස්තුව **රු. 120,000.00** ක් වේ.

- මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාර කිරිහල සහ සිල්ලර අලෙවිසැල සඳහා මාසික කුලිය සහ විදුලි ගාස්තුව **රු.5,000.00** බැගින් වාර්ෂික ගාස්තුව **රු. 60,000.00** ක් වේ.

ඉහත ගෙවීම් සෑම මසකම පලමු දින 10 ඇතුලත ගෙවා අදාල ලදු පත් අදාල පීඨයේ පීඨ කාර්යාලය/ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය වෙත ලබා දිය යුතුය.

09. විශ්වවිද්‍යාලය මගින් ආපනශාලා සේවාවේ ජල පරිභෝජනය වෙනුවෙන් බිල්පත් ගෙවීම සිදු කරනු ඇත.

10. සාර්ථක කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම් කාලය අවසාන වීමෙන් පසු රු. 50,000/- ක වටිනාකමින් යුතු **කාර්ය සාධන බැංකු සුරක්ෂණයක් හෝ ආපසු ගෙවනු ලබන තැන්පතුව** විශ්වවිද්‍යාලය විසින් නිදහස් කරනු ලැබේ (අඩු කිරීම් ඇති විට එම අඩු කිරීම් වලට යටත්ව).

11. කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හෝ කොන්ත්‍රාත්තු පැහැර හරිනු ලැබ **අසාදුලේඛණ**ගත වූ අය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් ඇති කරගනු නොලැබේ. කොන්ත්‍රාත්කරු එසේ නොවූවකු බවට දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

12. කොන්ත්‍රාත්තුව ලබන අය විසින් තමන්ගේ නමින් වෙනත් අයට අදාල ආපනශාලාව පවත්වාගෙන යාමට උප කොන්ත්‍රාත් ලබා දීම නීති විරෝධි වන අතර එවැනි අය අසාදුලේඛණ ගත කිරීමටත්, ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය අත්හිටුවීමට හා කාර්ය සාධන බැංකු සුරක්ෂණය/ ආපසු ගෙවනු ලබන තැන්පතුව මුදල් කර ගැනීමටත්, විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලැබේ.

13. මෙම කොන්ත්‍රාත්තුව ගිවිසුම් ගත වූ දින සිට වර්ෂයක කාල සීමාවක් දක්වා වලංගුය. එහෙත් මෙම කොන්ත්‍රාත් කාලය තෙමසක පරිවාස කාලයකට යටත් වන අතර එම පරිවාස කාලය තුළ නිසි අයුරින් ආපන ශාලාව පවත්වාගෙන යාමට අපොහොසත් වුවහොත් පරිවාස කාලය තුළදී හෝ පරිවාස කාලය අවසානයේදී හෝ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත් කාර්ය සාධන බැංකු සුරක්ෂණය/ ආපසු ගෙවනු ලබන තැන්පතුව (රු.50,000/-) මුදල් කර ගැනීමටත් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ඇත.

14. කොන්ත්‍රාත්තුව අවසන් වීමට මසකට පෙර කොන්ත්‍රාත්කරුට ඒ බව දැනුම් දෙනු ඇත. කොන්ත්‍රාත්කරුට සේවා පවත්වාගෙන යාමේ අපහසුතාවයක් ඇතොත් තෙමසකට පෙර විශ්වවිද්‍යාලයට දැනුම් දීමකින් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කළ හැකිය.

15. කොන්ත්‍රාත්කරු විසින් **කොන්ත්‍රාත් කාලය තුල නිසියාකාරව තම සේවය පවත්වාගෙන යාමට අපොහොසත් වීම නිසා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සිදුවුවහොත් ඉහත කාර්ය සාධන බැංකු සුරක්ෂණය හෝ ආපසු ගෙවනු ලබන තැන්පතුව මුදල් කර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ඇත.**

16. විශ්වවිද්‍යාලයට අයත් දේපළ/උපකරණවලට සිදුවන ඕනෑම හානියක්/අලාභයක් කාර්ය සාධන බැංකු සුරක්ෂණ/ මුදල් **තැන්පතු** මුදල ඉක්මවා ගියහොත් සිදුවී ඇති හානිය/අලාභයේ මුළු පිරිවැය ආවරණය කිරීමට අවශ්‍ය අමතර මුදල විශ්වවිද්‍යාලයට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී. සිදු වූ සැබෑ අලාභයට/හානියට සමානුපාතිකව එහි මුදල තක්සේරු කරනු ලබන අතර, සිදු වී ඇති අලාභයට/හානියට අදාල තක්සේරු මුදල විස්තර කරමින් විශ්වවිද්‍යාලයෙන් ලිඛිත දැනුම් දීමක් ලැබීමෙන් පසු එම සම්පූර්ණ මුදල විශ්ව විද්‍යාලය වෙත ගෙවීමට කොන්ත්‍රාත්කරු එකග විය යුතුය.

17. කාර්ය සාධන බැංකු සුරක්ෂණය හෝ ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල ඉක්මවා යන ඕනෑම හානියක්/අලාභයක් නිශ්චිත කාල රාමුව තුළ ගෙවීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම මෙම ගිවිසුම උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබේ. එවැනි අවස්ථාවක, කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු තක්සේරු ගත මුදල් අයකර ගැනීම සඳහා සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ .

18. ගිවිසුම් ගත කාල සීමාව අවසානයේ විශ්වවිද්‍යාලය විසින් ඔබට භාර දුන් සියලුම භාණ්ඩ නිසි ආකාරව විශ්වවිද්‍යාලය වෙත භාර දීමට කොන්ත්‍රාත්කරු එකග විය යුතුය. කොන්ත්‍රාත් කාලය අවසන් වීමට පෙර හානියට පත් භාණ්ඩ නැවත විශ්වවිද්‍යාලය වෙත ලබා දිය යුතුවේ.

19. යම් හෙයකින් කොන්ත්‍රාත්කරු ගිවිසුමේ දක්වා ඇති නියමයන්ට අනුකූල වීමට අපොහොසත් වුවහොත්, කොන්ත්‍රාත්කරු එම නියමයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් පොලිසිය වෙත විධිමත් පැමිණිල්ලක් ගොනු කිරීමටත් පසුව කොන්ත්‍රාත්කරුට එරෙහිව අදාල නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලැබේ.

20. සුදුසුකම් ලබන කොන්ත්‍රාත්කරුවන් විශ්වවිද්‍යාලයේ පවත්නා පොදු නීති රීති වලට අනුකූල විය යුතුය.

21. ආපනශාලා තුල පොලිතින් භාවිතය තහනම් වේ.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ,
කොළඹ විශ්වවිද්‍යාලය.

❖ **පහත සඳහන් ආපනශාලා/කිරිහල් සේවාවන් කුලී පදනම මත ඉහත අමුණා ඇති ලේඛණයේ සඳහන් කොන්දේසි වලට යටත්ව මිළ ගණන් කැඳවනු ලැබේ.**

| ආපනශාලා සේවාව/ කිරිහල් සේවාව | **සිසුන් ප්‍රමාණය** |
|---|---|
| **ආපනශාලා සේවාව -** | |
| • හෙද පීඨ ආපනශාලාව | 520 |
| • කළමනාකරණ හා මූල්‍ය පීඨ ආපනශාලාව | 2850 |
| • තාක්ෂණ පීඨ ආපනශාලාව | 1650 |
| **කිරිහල් සේවාව -** | |
| • මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාර ආපනශාලාව සහ සිල්ලර අලෙවිසැල | 300 |

# කොළඹ විශ්වවිද්‍යාලයේ ආපනශාලා සේවාවන් සඳහා මිල ගණන් කැඳවීමේ අයදුම් පත්‍රය

## මිල ලැයිස්තුව

**ආපනශාලාව : ……………………**

| අනු අංක | ආහාර වර්ගය | ප්‍රමාණය | ලංසු මිල |
|---|---|---|---|
| කෙටි කෑම | | | |
| 1 | කිරි තේ | 152 මි.ලී | |
| 2 | කහට තේ (with tea bag) | 152 මි.ලී | |
| 3 | කහට තේ තේ (without tea bag) | 152 මි.ලී | |
| 4 | චයිනීස් රෝල්ස් (මාළු) | ග්‍රෑම් 70 | |
| 5 | චයිනීස් රෝල්ස් (එළවළු) | ග්‍රෑම් 70 | |
| 6 | බිත්තර රොටි හොදි සමග (සම්පූර්ණ බිත්තරයක්) | ග්‍රෑම් 80 | |
| 7 | මාළු කට්ලට් | ග්‍රෑම් 40 | |
| 8 | එළවළු පැටිස් | ග්‍රෑම්40 | |
| 9 | ප්ලේන් ආප්ප | ග්‍රෑම් 60 | |
| 10 | බිත්තර ආප්ප | ග්‍රෑම් 80 | |
| 11 | පරිප්පු වඩේ | ග්‍රෑම් 50 | |
| 12 | උළුඳු වඩේ (උළුඳු සමග) | ග්‍රෑම් 50 | |
| 13 | සමෝසා | ග්‍රෑම් 45 | |
| උදේ ආහාර | | | |
| 1 | තෝසේ හොදි සහ සම්බෝල සමග | ග්‍රෑම් 80 | |
| 2 | පොල් රොටි ලුනු මිරිස් සමග | ග්‍රෑම් 80 | |
| 4 | එළවළු රොටි | ග්‍රෑම් 115 | |
| 5 | ඉදිආප්ප 10ක් සමග හොදි සහ සම්බෝල | ග්‍රෑම් 50 | |
| 6 | කඩල පිඟානක් | ග්‍රෑම්170 | |

| | | | |
|---|---|---|---|
| 7 | මුං ඇට පිඟානක් | ග්‍රෑම් 170 | |
| 8 | තම්බපු බිත්තරයක් | - | |
| | | | |
| 9 | මාළු සමග හොදි | ග්‍රෑම් 80 | |
| 10 | බිත්තරයක් සමග හොදි | - | |
| 11 | කුකුල් මස් සමග හොදි (මස් කැබැල්ල ග්‍රෑම් 28ක් විය යුතුය) | ග්‍රෑම් 28 | |
| 12 | පරිප්පු සමග හොදි | ග්‍රෑම් 80 | |
| 13 | අල සමග හොදි | ග්‍රෑම් 80 | |
| 14 | නූඩ්ල්ස් පිඟානක් හොදි සමග | ග්‍රෑම් 250 | |
| 15 | කොත්තු රොටි බිත්තර | ග්‍රෑම් 250 | |
| 16 | කිරිබත් කෑල්ලක් ලුණු මිරිස් සමග | ග්‍රෑම් 125 | |
| 17 | පාන් 1/2 හොදි සමග | ග්‍රෑම් 225 | |
| 18 | පරාටා එකක් හොදි සමග | ග්‍රෑම් 80 | |
| 19 | කොළ කැඳ | මි.ලී. 200 වීදුරුවක් | |
| 20 | කිතුල් පිටි කැඳ | මි.ලී. 200 වීදුරුවක් | |
| 21 | කුරක්කන් පිටි කැඳ | මි.ලී. 200 වීදුරුවක් | |
| 22 | මඤ්ඤොක්කා කොච්චි/ මිරිස් සම්බෝල සමග | ග්‍රෑම් 450 | |
| 23 | බත් පිඟානක් හෝ පාර්සලයක් පරිප්පු සමහ සම්බෝල හා හාල්මැස්සන්/කරවල/මාළු බැදුමක් | ග්‍රෑම් 450 | |
| **දිවා / රාත්‍රී ආහාරය** | | | |
| 1 | බත් පිඟානක් හෝ පාර්සලයක් එළවළු 03ක් සමග සළාදයක් හෝ සම්බෝලයක් | ග්‍රෑම් 450 | |
| 2 | බත් පිඟානක් හෝ පාර්සලයක් එළවළු 03ක් සහ මාළු (මාළු කැබැල්ල ග්රෑම් 28 ක් විය යුතුය) | ග්‍රෑම් 450 | |
| 3 | බත් පිඟානක් හෝ පාර්සලයක් එළවළු 03ක් සහ කුකුල් මස් (මස් කැබැල්ල ග්රෑම් 28 ක් විය යුතුය) | ග්‍රෑම් 450 | |
| 4 | බත් පිඟානක් හෝ පාරලයක් එළවළු 03ක් සහ බිත්තරයක් | ග්‍රෑම් 450 | |
| 5 | එළවළු ෆ්‍රයිඩ් රයිස් සළාදය සමග (සම්බා) | ග්‍රෑම් 450 | |
| 6 | බිත්තර ෆ්‍රයිඩ් රයිස් සළාදය සමග (සම්බා) | ග්‍රෑම් 450 | |
| 7 | බැදපු මාළු (පොඩි මාළු) | ග්‍රෑම් 30 | |
| 8 | බැදපු මාළු (ලොකු මාළු) | ග්‍රෑම් 30 | |

| | | | |
|---|---|---|---|
| 9 | බැදපු කුකුල් මස් කැබැල්ලක් | ග්‍රෑම් 30 | |
| 10 | බැදපු බිත්තර | එකක් | |
| | | | |
| 11 | අමතර බත් පිඟානක් | ග්‍රෑම් 84 | |
| **අතුරු පස** | | | |
| 1 | මී කිරි | කුඩා කප් එකක් | |
| 2 | අයිස් ක්‍රීම් | කුඩා කප් එකක් | |
| 3 | ෆෘට් සැලඩ් අයිස් ක්‍රීම් සමග | කුඩා කප් එකක් | |
| **වෙනත්** | | | |
| 1 | ඔරේන්ජ් ජූස් | මි.ලී. 200 වීදුරුවක් | |
| 2 | අලිගැටපේර අයිස් ක්‍රීම් සමග | මි.ලී. 200 වීදුරුවක් | |
| 3 | අයිස් කෝපි | මි.ලී. 200 වීදුරුවක් | |
| 4 | දිවුල් අයිස් ක්‍රීම් සමග | මි.ලී. 200 වීදුරුවක් | |
| 5 | පළතුරු බීම අයිස් ක්‍රීම් සමග | මි.ලී. 200 වීදුරුවක් | |
| 6 | සව් | මි.ලී. 200 වීදුරුවක් | |
| 7 | බටර් කේක් | ග්‍රෑම් 80 | |
| 8 | හැලප | ග්‍රෑම් 80 | |

- පිළියෙල කරනු ලබන ආහාර නියමිත ප්‍රමිතියකින් (නියමිත බර, රසය හා ගුණාත්මකභාවය) යුක්ත විය යුතු අතර කිසිඳු කෘත්‍රිම රසකාරක ද්‍රව්‍යයක් ආහාර සහ පානයන් සඳහා එක් නොකළ යුතුය.
- ආහාර පිසීමේදි හා පිළිගැන්වීමේදී සේවකයින් අත් වැසුම්/හිස් වැසුම්/මුඛ ආවරණ සහ නිල ඇඳුමක් සමග ඒප්‍රන් පැලදිය යුතුය.

1. අයදුම්කරුගේ නම : ........................................................................
2. ලිපිනය : ........................................................................

........................................................................

3. හැඳුනුම්පත් අංකය : ........................................................................
4. දුරකථන අංකය : ........................................................................
5. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය සහ දිනය : ..................................................
6. අදාල සේවාවේ පළපුරුද්ද වර්ෂ වලින් : ..................................................
(පළපුරුද්ද සනාථ කිරීමේ සේවා සහතික පිටපත් ඇමිණිය යුතුය)
7. යෙදවීමට බලාපොරොත්තු වන සේවකයින් සංඛ්‍යාව : ……………………….
8. අයදුම්කරුගේ අත්සන : ........................................................................
9. දිනය : ........................................................................

ඉහත දුරකථන අංක වල වෙනසක් වුවහොත් ඒ බව විශ්වවිද්‍යාලයට දැනුම් දිය යුතුය.

**කොළඹ විශ්වවිද්‍යාලයේ**

**කිරිහල් සේවාව සඳහා මිල ගණන් කැඳවීමේ අයදුම් පත්‍රය**

**කිරිහල් සේවාව -………………………………………………**

| **අනු අංකය** | **ආහාර වර්ගය** | **ප්‍රමාණය** | මිල(රු.) |
|---|---|---|---|
| **කිරි වර්ග** | | | |
| 1 | හයිලන්ඩ් (වැනිලා) | බෝතලයක් (250ml) | |
| | | පැකට් එකක් (180ml) | |
| | හයිලන්ඩ් (චොක්ලට්) | බෝතලයක් (250ml) | |
| | | පැකට් එකක් (180ml) | |
| 2 | නිව්ඩේල් (වැනිලා) යෝගට් පාන | බෝතලයක් (180ml) | |
| | | පැකට් එකක් (180ml) | |
| | නිව්ඩේල් (චොක්ලට්) | බෝතලයක් (180ml) | |
| | | පැකට් එකක් (180ml) | |
| 3 | කොත්මලේ(වැනිලා)යෝගට් පාන | බෝතලයක් (180ml) | |
| | | පැකට් එකක් (180ml) | |
| | රිච් ලයිෆ් (වැනිලා) | බෝතලයක් (180ml) | |
| | | පැකට් එකක් (180ml) | |
| 5 | නෙස්ලේ (වැනිලා) | බෝතලයක් | |
| | | පැකට් එකක් (180ml) | |
| | නෙස්ලේ (චොක්ලට්) | බෝතලයක් | |
| | | පැකට් එකක් (180ml) | |
| 6 | මයිලෝ | පැකට් එකක් (180ml) | |
| 7 | නෙස්ටමෝල්ට් | පැකට් එකක් (180ml) | |
| **යෝගට් වර්ග / යෝගට් පාන** | | | |
| 1 | හයිලන්ඩ් | කප් එකක් (90g) | |
| | හයිලන්ඩ් (පලතුරු) | කප් එකක් (90g) | |
| | හයිලන්ඩ් (ජෙලි) | කප් එකක් (90g) | |
| 2 | නිව්ඩේල් | කප් එකක් (90g) | |
| | නිව්ඩේල් (පලතුරු) | කප් එකක් (90g) | |
| | අඹේවෙල යෝගට් | කප් එකක් (90g) | |

| | | | |
|---|---|---|---|
| | | | |
| 3 | කොත්මලේ | කප් එකක් (90g) | |
| | කොත්මලේ යෝගට් පානය | බෝතලයක් (200ml) | |
| 4 | රිච් ලයිෆ් | කප් එකක් (90g) | |
| | රිච් ලයිෆ් (යෝගට් පානය) | කප් එකක් (90g) | |
| 5 | වෙනත් යෝගට් / යෝගට් පාන | | |
| අයිස්ක්‍රීම් වර්ග | | | |
| 1 | එලිෆන්ට් හවුස් | කප් එකක් (80ml)) | |
| | කෝන් වර්ග | චොක්ලට් (120ml) | |
| | | වැනිලා (120ml) | |
| 2 | කොත්මලේ | කප් එකක් වැනිලා (80ml) | |
| | කාගීල්ස් | කප් එකක් (80ml)) | |
| 3 | හයිලන්ඩ් | කප් එකක් වැනිලා (80ml) | |
| | | චොකලට් කෝන් | |
| | | ෆලූඩා පලම් | |
| 5 | වෙනත් අයිස්ක්‍රීම් වර්ග | | |
| **පලතුරු බීම** | | | |
| 1 | ෆලූඩා | අයිස්ක්‍රීම් සමග මි.ලී. 200 වීදුරුවක් | |
| 2 | ලෙමන් ජූස් | මි.ලී. 200 වීදුරුවක් | |
| 3 | ඔරේන්ජ් ජූස් | මි.ලී. 200 වීදුරුවක් | |
| 4 | අලිගැටපේර | අයිස්ක්‍රීම් සමග මි.ලී. 200 වීදුරුවක් | |
| 5 | අලිගැටපේර | මි.ලී. 200 වීදුරුවක් | |
| 6 | අයිස් කෝපි | මි.ලී. 200 වීදුරුවක් | |
| 7 | දිවුල් | මි.ලී. 200 වීදුරුවක් | |
| 8 | දිවුල් | අයිස්ක්‍රීම් සමග මි.ලී. 200 වීදුරුවක් | |
| 9 | පලතුරු බීම | අයිස්ක්‍රීම් සමග මි.ලී. 200 වීදුරුවක් | |
| 10 | පලතුරු බීම | මි.ලී. 200 වීදුරුවක් | |
| 11 | සව් | මි.ලී. 200 වීදුරුවක් | |
| | | | |

| | | | |
|---|---|---|---|
| **සිසිල් කල බීම වර්ග** | | | |
| 1 | අලියා බීම (මෙගා බෝතල්) | ලොකු (1.5 L) | |
| | අලියා බීම (මීඩියම්) | කුඩා (400ml) | |
| 2 | පෙප්සි | ලොකු (1.5 L) | |
| | | කුඩා (175ml) | |
| | | කුඩා (300ml) | |
| 3 | සෙවන්අප් | කුඩා (300ml) | |
| 4 | ෆැන්ටා | 175ml) | |
| | | කුඩා (300ml) | |
| 5 | පෝටෙලෝ (මෙගා බෝතල්) | 175ml | |
| | (මීඩියම්) | කුඩා (300ml) | |
| 6 | ජින්ජර් බියර් | ලොකු (1.5 L) | |
| | | කුඩා (300ml) | |
| 7 | ස්ප්‍රයිට් | 175ml | |
| | | කුඩා (3300ml) | |
| | | කුඩා (175ml) | |
| 8 | කොකාකෝලා | ලොකු (1.5 L) | |
| | | කුඩා (330ml) | |
| | | කුඩා (175ml) | |
| 9 | ස්මැක් | ලොකු | |
| | | කුඩා ප්ලාස්ටික් බෝතලය | |
| 10 | වෙනත් සිසිල් කල බීම වර්ග | | |
| | සියලුම බීම බඩි ප්‍රමාණය | 175ml | |
| **උනුසුම් පාන** | | | |
| 1 | නෙස්ටමෝල්ට් | කප් එකක් | |
| 2 | නෙස්කැෆේ | කප් එකක් | |
| 3 | නෙස් ටී | කප් එකක් | |
| **වෙනත්** | | | |
| 1 | එළකිරි | මි.ලී. 100 වීදුරුවක් | |
| 2 | ජෙලි | මි.ලී.80 කප් එකක් | |
| 3 | වටලප්පන් | මි.ලී.80 කප් එකක් | |
| 4 | මුදවපු කිරි | කුඩා හට්ටි එකක් | |
| 5 | කේක් | ග්‍රෑම් 100 කෑලි එකක් | |
| 6 | බිස්කට් | පැකට් එකක් මාරි | |
| 7 | ඖෂධීය කැඳ/කොළ කැඳ | මි.ලී. 100 වීදුරුවක් | |
| 8 | හැලප | ග්‍රෑම් 80 | |

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

- පිළියෙල කරනු ලබන ආහාර නියමිත ප්‍රමිතියකින් (නියමිත බර, රසය හා ගුණාත්මකභාවය) යුක්ත විය යුතු අතර කිසිඳු කෘත්‍රිම රසකාරක ද්‍රව්‍යයක් ආහාර සහ පානයන් සඳහා එක් නොකළ යුතුය.

- ආහාර පිසීමේදි හා පිළිගැන්වීමේදී සේවකයින් අත් වැසුම්/හිස් වැසුම්/මුඛ ආවරණ සහ නිල ඇඳුමක් සමග ඒප්‍රන් පැළඳිය යුතුය.

1. අයදුම්කරුගේ නම : ........................................................................................................

2. ලිපිනය : .......................................................................................................

........................................................................................................

3. හැඳුනුම්පත් අංකය : ........................................................................................................

4. දුරකථන අංකය : ........................................................................................................

5. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය සහ දිනය : ......................................................................................

6. අදාල සේවාවේ පළපුරුද්ද වර්ෂ වලින් : ......................................................................................
(පළපුරුද්ද සනාථ කිරීමේ සේවා සහතික පිටපත් ඇමිණිය යුතුය)

7. යෙදවීමට බලාපොරොත්තු වන සේවකයින් සංඛ්‍යාව : ……………..................................……………

8. අයදුම්කරුගේ අත්සන : ........................................................................................................

9. දිනය : ........................................................................................................

ඉහත දුරකථන අංක වල වෙනසක් වුවහොත් ඒ බව විශ්වවිද්‍යාලයට දැනුම් දිය යුතුය.